ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1991 අංක 35 දරන
# රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථ සාධක සංගමය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 අගෝස්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 අගෝස්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1991 අංක 35 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථ සාධක සංගමය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 අගෝස්තු මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 85/90

**රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථ සාධක සංගමය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—**

1. මේ පනත 1991 අංක 35 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථ සාධක සංගමය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථ සාධක සංගමය ආඥාපනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— **283 වන අධිකාරයේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

"පොදු පරමාර්ථ. 3. සකසුරුවම දිරිගැන්වීම, අසනීප හෝ ආපදා අවස්ථාවන්හිදී සාමාජිකයන්ට සහන සැලසීම, සාමාජිකයන් ආර්ථික දුෂ්කරතාවලට පත්වූ අවස්ථාවන්හිදී ඔවුන්ට උපකාර කිරීම, විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට ප්‍රතිලාභ සැලසීම සහ ඔවුන්ගේ කලත්‍රයින් නීත්‍යනුකූල දරුවන්, ලමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනත ප්‍රකාර දරුකමට හදාගැනීමේ ආඥාවක් කරනු ලැබ ඇත්තේ යම් දරුවන් සම්බන්ධයෙන් ද ඒ දරුවන්, සහ එවැනි යම් නීත්‍යනුකූල හෝ දරුකමට හදාගත් දරුවකුගේ නීත්‍යනුකූල දරුවන් සඳහා සහ පියවරුන්, මව්වරුන්, සොහොයුරන්, සොහොයුරියන්, බෑණාවරුන් සහ ලේලිවරියන් සඳහා ප්‍රතිපාදන සැලසීම, සංස්ථාව සංස්ථාපනය කිරීමේ පොදු අරමුණු වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "එක් එක් වර්ෂයේ ජූනි මස තිස්වන දින" යන වචන වෙනුවට "එක් එක් වර්ෂයේ අගෝස්තු මස තිස් එක්වන දින" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. **අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.